*සැ. යු.* - (i) 2022.04.12 දින පළ වූ 2276 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,277 - 2022 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2022.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 392 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 395 |

*සැ. යු.* - ජයමග සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මැයි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

391- B 082335 — 353 (2022/04)
D 1 -

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වගන්තිය ප්‍රකාරව කරනු ලබන පිස්කල් විකිණීම

### පොළොන්නරුව දිසා අධිකරණයේ දී ය

කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 75,
ප්‍රධාන කාර්යාලය පිහිටි මහජන බැංකුව

නඩු අංකය : 585/ඩීආර්/18
ස්වභාවය : මුදල්
ඇස්කීසි අංකය : 376/20

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. කරලියද්දෑවාස් ජයසූරිය පටබැදිගේ ප්‍රසාද් හේමන්ත *නොහොත්* ප්‍රසාද් හේමන්ත ජයසූරිය, (සිහල රයිස් ප්‍රොඩක්ට් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ), අංක 99/1, ගනන්ගොල්ල, පරාක්‍රම සමුද්‍රය, පොළොන්නරුව.

පොළොන්නරුව දිසා අධිකරණ නඩු අංක : 585/ඩීආර්/18 දරන නඩුවේ 2019.05.17 වැනි දිනැති නියත තීන්දු ප්‍රකාශය අනුව මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට පැමිණිලිකරුට අය විය යුතු රු. 1,904,943.69ක මුදල හා එකී මුදල අයකර ගැනීමට පැමිණිලිකරුට දරන්නට වන වියදම විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා වර්ෂ 2020.10.14 වැනි දින පොළොන්නරුව දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් තහනමට ගන්නා ලද එකී නඩුවේ විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් වන චංචල දේපළ,

**වර්ෂ 2022ක් වූ අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 11.30ට** එකී දේපළ පිහිටි අංක 99/1, ගනන්ගොල්ල, පරාක්‍රම සමුද්‍රය, පොළොන්නරුව යන ලිපිනයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

තහනමට ගත් දේපළ

| | |
|---|---|
| 1 | තොෂිබා වර්ගයේ අඟල් 32 රූපවාහිනී යන්ත්‍රය |
| 2 | ඉනොවෙක්ස් වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 3 | T.V. ස්ටෑන්ඩ් 01 |
| 4 | කහපාට ප්ලාස්ටික් පුටු 03 |
| 5 | කෑලි 06 ලී පුටු සෙට් 01ක් ස්ටූලය ද සමග |
| 6 | පුටුව සමග ලියන මේස 01 |
| 7 | වීදුරු කෑම මේසය පුටු 06 සමග |
| 8 | කෑලි 05 තේක්ක පුටු සෙට් 01 |
| 9 | L. G. තනි දොර ශීතකරණය |
| 10 | සිංගර් මහන මැෂිම |
| 11 | සැම්සුන්ග් වර්ගයේ අඟල් 40 TV DVD ප්ලේයරය |
| 12 | CCTV කැමරා පද්ධතිය මොනිටරය සමග |
| 13 | 4 x 4 TV ස්ටෑන්ඩ් 01 |
| 14 | MIRA වර්ගයේ ස්ටෑන්ඩ් ෆෑන් 01යි |
| 15 | අඩි 6 දොර 02 ලී අල්මාරි 01 |
| 16 | JAC උණුවතුර ෂවර් 01 |
| 17 | රිච් පවර් ස්ටෑන්ඩ් ෆෑන් 01 |

| | |
|---|---|
| 18 | අඩි 6 දූව කණ්නාඩි මේස 01 |
| 19 | අඩි 06 දොර 02 වානේ අල්මාරි 01 |
| 20 | අල්මාරිය සහිත අයන් බෝඩ් 01 |
| 21 | SL 3901 - AAG වර්ගයේ අංක 801145 බිම් තරාදිය |
| 22 | Royal වර්ගයේ බිම් තරාදි 01 |
| 23 | IDEN - FAN ගල්වැලි ඉවත් කරන යන්ත්‍රය |
| 24 | FAN - DE SPONIER SEAKAR සල්ලඩය |
| 25 | නවීන පන්නයේ උපාංග සහිත වී කොටන යන්ත්‍ර 01 |
| 26 | පිටි කොටන යන්ත්‍ර 01 |
| 27 | කුඩා ඉලෙක්ට්‍රික් තරාදි 01 |

ඒ. එස්. දිසාගේ,
නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්/ප්‍රොබට් නිලධාරි,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

04-522

---

## හම්බන්තොට දිසා අධිකරණයේ උකස් නඩු තීන්දුවක් යටතේ

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

සෙලාන් බැන්ක් පී.එල්.සී. (කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් ලෙස හැඳින්වූ) සෙලාන් ටවර්ස්,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : MB 7786

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

රාමනායක ප්‍රේමචන්ද්‍ර,
රාමනායක ස්ටෝර්ස්,
චිත්‍රාගල, අම්බලන්තොට.

..........................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ 2016.09.27 දින ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව සහ එහි 2018.10.10 දින මා වෙත නිකුත් කරන ලද විකිණීමේ ආඥාව අනුව ඉහත නම සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු රුපියල් හැත්තෑ හත් ලක්ෂ අනූහත් දහස් නමසිය පනස්තුනයි ශත දහනවයක් (රු. 77,97,953.19) ක මුදලක් ද තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය ද නඩු ගාස්තු ද මේ දක්වා ගෙවීමට අපොහොසත් වී ඇති හෙයින් එම මුදල සහ වෙන්දේසි වියදම් ආදිය අය කර ගැනීමට එකී බැංකුවට උකස් කර ඇති පහත උපලේඛනයේ දක්වා ඇති විත්තිකරුට අයත් දේපල සහ පරිශ්‍රය වර්ෂ 2022ක් වූ මැයි මස 26 වැනි දින පෙ. ව. 11.00 සිට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* හම්බන්තොට අම්බලන්තොට ප්‍රධාන මාර්ගයේ හම්බන්තොට බස් නැවතුම්පොළේ සිට අම්බලන්තොට දෙසට කි. මී. 14ක් ගිය විට හමුවන 230 කි. මී. කණුව පිහිටි මානජ්ජාව හන්දියෙන් දකුණට හැරී කොග්ගල පාරේ කි. මී. 1.2ක් ගිය විට පාරට යාව වම් පසින් මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත දැක්වෙන පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට විසිපහක් (25%)
2. පළාත් පාලන අධිකාරියට විකුණුම් බදු (පවතින නීතිය අනුව)
3. වෙන්දේසිකරුගේ කොමිස් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%)
4. තක්සේරු ගාස්තු
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු (රු. 2,000)
6. ගැසට් පත්‍රයේ ගාස්තු, පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ඇතුළු වෙන්දේසියේ සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් සියලුම වෙන්දේසි වියදම් ද එවෙලේම මුදලින් ගෙවිය යුතු ය.

චෙක්පත් භාරගනු නොලැබේ.

ගැනුම් මිලෙන් ඉතිරි 75% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත හම්බන්තොට දිසා අධිකරණයේ එකී MB 7786 දරන නඩුවට තැන්පත් කළ යුතුය. එසේ නොගෙව්වහොත් දැනටමත් ගැනුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමටත් සහ දේපල නැවත විකිණීමටත් පැමිණිලිකාර බැංකුවට බලය ඇත.

7. හිමිකම් ඔප්පු පරීක්ෂාව :

සෙලාන් බැන්ක් පීඑල්සී ප්‍රාදේශීය කාර්යාලය (දකුණු පළාත)
අංක 39බී, පහළ ඩික්සන් පාර, වලව්වත්ත, ගාල්ල.
දුරකථන අංක - 091 2235398
වැඩි විස්තර සඳහා විමසන්න - සෙලාන් බැන්ක් පීඑල්සී හම්බන්තොට ශාඛාව
අංක 57A, 57A1, 57A 1/1, මහ වීදිය, හම්බන්තොට.

දුරකථන අංක - 047 - 2220518 සහ 047-2220507

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 128 මානප්ජාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කරිවිල පිහිටි ''කරිවිල නමැති ඉඩමට'' බලයලත් මිනින්දෝරු K. W. S. K. වික්නරාජා විසින් මැන සාදන ලද අංක Ha 851 සහ 2008.02.16 දිනැති පිඹුරෙහි නිරූපිත ලොට් 02 A දරන බෙදු වෙන්කරන ලද බිම් කොටසට මායිම,

| | | |
|---|---|---|
| උතුරට | : | ඩී. රාමනායක සහ එස්. රාමනායක අයිතිවාසිකම් කියන ඉඩම, පිඹුරු අංක 6801 හි ලොට් 01 සහ, පිඹුරු අංක Ha 851 හි ලොට් 02 B ද, |
| නැගෙනහිරට | : | පාර ද, |
| දකුණට | : | පිඹුරු අංක Ha 6801 හි ලොට් 03 ද, |
| බස්නාහිරට | : | ඩී. රාමනායක සහ එස්. රාමනායක අයිතිවාසිකම් කියන ඉහත කී ඉඩම ද, පිඹුරු අංක Ha 6801 හි ලොට් 01 ද, |

යන මායිම් තුළ වූ රූඩ් එකයි පර්චස් තිස්අටයි දශම පහක් (අ. 0, රූ. 01, පර්. 38.5) හෙවත් හෙක්ටයාර් 0.1986 විශාලත්වයෙන් යුතු බිම් කොටස තුළ පිහිටි පොළොව ගහකොළ, වැව්ලි සහ ගොඩනැගිලි ද සමඟ වේ.

මෙම ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු / වෙළුම් D / 43 / 271 හි ලියාපදිංචි වී ඇත.

එන්. එච්. පී. පී. ආරියරත්න,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

අංක 107, උපතිස්ස මාවත,
වල්ගම දකුණ, මාතර.

දුරකථන අංක - 071 1885677 / 077 3281956

04-712

# විවිධ දැන්වීම්

**ඈවර කිරීමේ නියෝගය (19 වන රීතිය)**

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

**ශැන්බි ජීන්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 වැනි වගන්තියේ විධිවිධානයන් යටතේ වර්ෂ 2019 ක් වූ මැයි මස විසි අට වැනි දින අධිකරණය (වාණිජ මහාධිකරණය (සිවිල්) කොළඹ, අංක 12) විසින් ගණන් බේරා වසා දමන ලෙසට ද, මෙම සමාගමේ කටයුතුවලට ඈවරකරුවෙකු පත්කරන ලෙසට ද අධිකරණය විසින් නියෝග කරන ලදී.

| | | |
|---|---|---|
| අධිකරණය | : | වාණිජ මහාධිකරණය, කොළඹ 12 |
| නඩු අංකය | : | 58/2018/CO |
| නියෝගය කළ දිනය | : | 2019/05/28 |
| සමාගමේ නම | : | ශැන්බි ජීන්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | PV 13051 |
| සමාගමේ ලියාපදිංචි ලිපිනය | : | අංක 06, ආරාමය පාර, කොළඹ 09 |

04-612/1

---

**ඈවරකරු පත්කිරීම දැනුම් දීම (17 වන රීතිය)**

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

**ශැන්බි ජීන්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ඩබ්ලියු. ඒ. බී. විමලසිරි වන මම ශැන්බි ජීන්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඈවරකරු වශයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ පැවැත්වෙන නඩු අංක 58/2018/CO දරන නඩුවෙහිදී, ගරු මහාධිකරණය විසින් පත්කොට ඇති බව මෙයින් දැනුම් දෙමි.

| | | |
|---|---|---|
| අධිකරණය | : | වාණිජ මහාධිකරණය, කොළඹ 12 |
| නඩු අංකය | : | 58/2018/CO |
| පත්කළ දිනය | : | 2022/03/29 |
| සමාගමේ නම | : | ශැන්බි ජීන්ස් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ ලියාපදිංචි අංකය | : | PV 13051 |
| සමාගමේ ලියාපදිංචි ලිපිනය | : | අංක 06, ආරාමය පාර, කොළඹ 09 |
| ඈවරකරුගේ සම්පූර්ණ නම | : | විස්සහපුරගේ අමල් බුද්ධික විමලසිරි |
| ඈවරකරු ලිපිනය | : | එච්. ටී. පීරිස් සහ සමාගම, අංක 298 4/1, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 |
| දුරකථන අංක | : | 076-6423706 / 0112 575105 |

04-612/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.